වාර්ෂික වාර්තාව සහ ගිණුම්
வருடாந்த அறிக்கையும் கணக்கும்
ANNUAL REPORT AND ACCOUNTS

2014

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
உள்ளூர் கடன்கள் மற்றும் அபிவிருத்தி நிதியம்
LOCAL LOANS AND DEVELOPMENT FUND

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

உள்ளக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சிஅமைச்சு

Ministry of Internal & Home Affairs and Provincial Councils & Local Government

දේශීය ණය සහ සංවර්ධන අරමුදල

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2014

අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පටුන

1. කොමසාරිස් මණ්ඩලය 04

2. දර්ශනය, මෙහෙවර, අරමුදල්, සංස්ථාපනය, අරමුණු 05

3. ආයතනික තොරතුරු 06

4. පාලන ක්‍රියාවළිය 07

5. මෙහෙයුම් හා මූල්‍ය විග්‍රහය 10

6. ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති 13

7. විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව 15

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

8. ආදායම් වියදම් ගිණුම 19

9. මූල්‍ය තත්ව ප්‍රකාශය 20

10. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 22

11. ගිණුම්කරණ ප්‍රතිපත්ති 31

12. ණය නිකුත් කිරීමේ සාරාංශය 35

13. ග්‍රාපිත සමාලෝචනය 37

14. විගණකාධිපති වාර්තාව 45

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
කොමසාරිස් මණ්ඩලය

(2014.12.31 දිනට)

සභාපති

01. ආර්.ඒ.ඒ.කේ.රණවක මහතා - ලේකම්, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය

භාණ්ඩාගාර නියෝජනය

02. එන්.කුලසේකර මහතා - ප්‍රධාන ගණකාධිකාරී, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

සාමාජිකයින්

03	එච්.එම්.බී.පී.හේරත් මහතා	පළාත් පාලන කොමසාරිස්	(වයඹ පළාත)
04	බී.එච්.එන්.ජයවික්‍රම මහතා	පළාත් පාලන කොමසාරිස්	(මධ්‍යම පළාත)
05	ඩබ්.ඒ.ටී.මානෙල් මහත්මිය	පළාත් පාලන කොමසාරිස්	(උතුරු මැද පළාත)
06	එස්.ජේ.එම්.එච්.සී.සමරකෝන් මහත්මිය	පළාත් පාලන කොමසාරිස්	(බස්නාහිර පළාත)
07	එල්.එල්.අනිල් විජේසිරි මහතා	පළාත් පාලන කොමසාරිස්	(ඌව පළාත)
08	ඩී.ඩබ්.එස්.රාජපක්ෂ මහත්මිය	පළාත් පාලන කොමසාරිස්	(සබරගමුව පළාත)
09	එම්.වයි.සලීම් මහතා	පළාත් පාලන කොමසාරිස්	(නැගෙනහිර පළාත)
10	එම්.ජෙගු මහතා	පළාත් පාලන කොමසාරිස්	(උතුරු පළාත)
11	දිලේකා කුඩාච්චි මහත්මිය	පළාත් පාලන කොමසාරිස්	(දකුණු පළාත)
12	එස්.ඩබ්.ගමගේ මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	
13	වජිර ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	
14	එච්.එම්.එම්.දිසානායක මහත්මිය	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	

වාර්ෂික වාර්තාව සහ ගිණුම් - 2014

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

දැක්ම

පළාත් පාලන බල ප්‍රදේශ වල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැපයීමේ ප්‍රධාන මූල්‍ය ආයතනය වීම මගින් මෙරට ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම.

මෙහෙවර

ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය මූලික පහසුකම් සැපයීමට අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සපයනු ලබන තිරසාර සහ ස්වාධීන ආයතනයක් බවට පත්වීම.

අරමුණ

නීතියෙන් බලය ලැබී ඇති පරිදි පළාත් පාලන ආයතන වලට මහජන උපයෝගීතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොළියකට මූල්‍ය පහසුකම් සැපයීම සහ අනුබල ලබාදීම.

අරමුදල්

ණය දීම සඳහා අවශ්‍ය අරමුදල් සහන පොළී ප්‍රතිශතයක් මත මධ්‍යම රජයේ වාර්ෂික අයවැයෙන් දීර්ඝ කාලීන ණය මුදලක් වශයෙන් නිකුත් කරනු ලැබේ. ආසියානු සංවර්ධන බැංකු ණය අංක 1632 SRI (SF) සහ 2201 SRI (SF) සඳහා වන චක්‍රීය අරමුදල් ද ණය නිකුත් කිරීම සඳහා උපයෝගී වී ඇත. 2009 වර්ෂයේදී රු.මි.25 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන ඇති අතර 2010 - 2014 වර්ෂ වලදී අරමුදල් ලබාගෙන නොමැත.

ආයතනික තොරතුරු

සංස්ථාපනය

1916 අංක 22 දරණ ආඥා පනත යටතේ ආරම්භ කරන ලදුව, 1930 අංක 06, 1931 අංක 25, 1938 අංක 43, 1942 අංක 21 දරණ ආඥා පනත්, සහ 1949 අංක 29 දරණ පනත, 1974 අංක 09 දරණ නීතිය සහ 1993 අංක 24 දරණ පනත යන පනත් වලින් සංශෝධිත දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය ව්‍යවස්ථාපිත ආයතනයකි. මෙම ආයතනය 2010 වර්ෂයේ සිට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ අතර නැවත 2015 වර්ෂයේදී පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය යටතේ පාලනය වේ.

කාර්යභාරය

ශ්‍රී ලංකාව තුල මහ නගර සභා 24, නගර සභා 41 සහ ප්‍රාදේශීය සභා 276 ලෙස සංස්ථාපනය කර ඇති පළාත් පාලන ආයතන 341 ක් සඳහා ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී පදනමක් මත සැපයීම මූලික කාර්යභාරය වේ.

ලියාපදිංචි ස්ථානය	නො. **24**/A, වෝඩ් පෙදෙස, කොළඹ 07
දුරකථනය	011-2687514
ෆැක්ස්	011-2691261
විද්‍යුත් තැපැල්	lldf1916@gmail.lk

කොමසාරිස් මණ්ඩලයේ සංයුතිය

1993 අංක 24 දරණ දේශීය ණය සහ සංවර්ධන (සංශෝධිත) පනතේ අංක 2 ප්‍රකාර කොමසාරිස් මණ්ඩලය ගරු අමාත්‍යතුමා විසින් පත්කරනු ලබන අවම වශයෙන් සාමාජිකයින් 13 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(අ) සභාපති - පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්
(ආ) මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් නම්කරනු ලබන එක් අයෙකු
(ඇ) එක් එක් පළාත් සභාවල ආණ්ඩුකාරවරුන් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් 09 දෙනෙකු
(ඈ) ගරු අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකු.

විගණකවරු: විගණකාධිපති දෙපාර්තමේන්තුව
අභ්‍යන්තර විගණනය: අභ්‍යන්තර විගණන අංශය - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
බැංකු කරුවෝ: ලංකා බැංකුව

කාර්ය මණ්ඩලය

2014 දෙසැම්බර් 31 දිනට අරමුදලේ කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

ප්‍රධාන විධායක නිලධාරී	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (මෙහෙයුම්)	01
සහකාර ගණකාධිකාරී	01
සංවර්ධන නිලධාරී	22
කළමනාකරණ සහකාර	06
රියදුරු	01
කාර්යාල කාර්ය සහායක	02
එකතුව	**34**

පාලන ක්‍රියාවලිය

ආයතනයේ පාලන ක්‍රියාවලිය කොමසාරිස් මණ්ඩලය මගින් ක්‍රියාත්මක වන සංයුක්ත ක්‍රියාවලියක් වශයෙන් හැඳින්විය හැකිය. පාලන ක්‍රමයක වැදගත්ම අංගය වන මෙය ආයතනයේ ඒකාබද්ධ සාර්ථකත්වය සහ අඛණ්ඩ ආර්ථිකමය පැවත්මට ඉවහල් වේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය, ඒකාබද්ධ පාලන ක්‍රියාවලිය පවත්වා ගැනීම මගින් ව්‍යාපාරික ආචාර ධර්ම, පාරදෘෂ්‍යතාවය සහ ඉහළ වගකීම් තත්වයන් පවත්වාගැනීම සඳහා බැඳී ඇත.

කොමසාරිස් මණ්ඩලය

සංයුතිය

කොමසාරිස් මණ්ඩලයසභාපති ඇතුළු දාහතර දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන්ගේ විශේෂිත දැනුම සහ පළපුරුද්ද ආයතනයේ ව්‍යාපාරික ක්‍රියාවලියට උපකාරි වේ. කොමසාරිස්මණ්ඩල සාමාජිකයින් කිසිවකු ආයතනය සමග ගනුදෙනු වලට සම්බන්ධවී නැති අතර එය ඔවුන්ගේ කාර්යයන් ඉටුකිරීමේදී ස්වාධීනත්වය පවත්වාගෙන යාමට ඉවහල් වී ඇත.

තීරණ ගැනීම

කොමසාරිස්මණ්ඩල සාමාජිකයින් මසකට වරක් රැස්වන අතර එහිදී එදිනෙදා කටයුතු ද විමර්ෂනයට භාජනය කරන අතරම සුවිශේෂ වැදගත් ප්‍රතිපත්තිමය තිරණ ද ගනු ලැබේ. තවද කොමසාරිස් මණ්ඩල සාමාජිකයින් විසින් ආයතනික අරමුණු ලඟාකරගැනීමට අදාළ වන උපාය මාර්ගද තීරණය කරනු ඇත.

වගකීම

1. ආයතනික ශක්තිය, කාර්යක්ෂමතාව සහ අවදානම සැලකිල්ලට ගනිමින් ව්‍යාපාර උපාය මාර්ග සැකසීම.
2. ඉහත උපායමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය.
3. පවතින ක්‍රමවේදයේ ක්‍රියාකාරිත්වයට අදාළව අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලනය, ආචාරධර්ම, පවතින නීති සහ ව්‍යවස්ථාවලට අනුකූලතාවය දක්වන බවට වගබලාගැනීම.
4. ප්‍රාග්ධන වියදම් නිරීක්ෂණ සහ අභිමන්ත්‍රණය හා සමාලෝචනය.
5. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්යසාධනය අධීක්ෂණය.
6. තොරතුරු ක්‍රමවේදය සහ විගණන ක්‍රියාවලිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට වගබලාගැනීම.

ස්වාධීන විනිශ්වය

කොමසාරිස් මණ්ඩලයේ ක්‍රියාකාරකම් වලදී සෑම කොමසාරිස්වරයෙකුම තම ස්වාධීන මතය ප්‍රකාශ කළ යුතු අතර, අනෙක් පාර්ශව වල අයුතු බලපෑම් වලට හෝ අගති ගාමී බලපෑම් වලට යටත් නොවිය යුතුය. උපායමාර්ග පිළිබඳ තීරණ ගැනීම, උපාය මාර්ග ක්‍රියාවට නැංවීම, කාර්යසාධන සමාලෝචනය සම්පත් බෙදාහැරීම සහ ව්‍යාපාරික ආචාරධර්ම පවත්වාගෙන යාම ආදී කටයුතු සඳහා කොමසාරිස් වරුන්ගේ අවධානය යොමුවේ.

සභාපති

සභාපතිගේ කාර්යභාරය පැහැදිළිව විස්තර කර වෙන්කර දක්වා ඇති අතර එමගින් ආයතන රාමුව තුල එනිසා බල තුලනයක් නිර්මාණය වී ඇත. පුද්ගලයන්ගේ තනි කැමැත්ත අනුව තීරණ ගැනීමේ ස්වභාවය සීමාවී ඇත.

සභාපතිගේ කාර්යභාරය

සභාපතිගේ නායකත්වය යටතේ කොමසාරිස් මණ්ඩලය නියමිත උපායමාර්ග වෙත මගපෙන්වීම සහිතව වෘත්තීමය ස්වභාවයෙන් කටයුතු කිරීමට සලස්වා ඇත. කොමසාරිස් මණ්ඩලය වෘත්තීමය ආකාරයෙන් මෙහෙයවීම හා මග පෙන්වීම සඳහා නායකත්වය දීමට ඔහුට හැකියාව ඇත.

කොමසාරිස් මණ්ඩලය පත්කිරීම

කොමසාරිස් මණ්ඩලය පත්කිරීමේ ක්‍රියා පටිපාටිය ඉතා පැහැදිලි විනිවිද භාවයෙන් යුක්ත වන අතර එය අදාළ ආඥා පනත අනුව පැහැදිලි කර ඇත.

විගණනය සහ වගකීම

ආයතනික තත්වය සහ අනාගතය ඇගයීම

ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද සහිතව මෙම ආයතනයේ අනාගත දැක්මට අනුව රාජ්‍ය අංශයේ ''සී'' පංතියේ ආයතනයක් වශයෙන් කටයුතු කරගැනීම සඳහා ආයතනයේ කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකර ඇති අතර ඒ සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ වරුන් දෙදෙනෙකු බඳවාගැනීමට කටයුතුකර ඇත.

මනා අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාම හා අවදානම් කළමනාකරණය

කොමසාරිස් වරුන් විසින් ක්‍රියාවට නංවන ලද අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය මගින් ආයතනයේ ආයෝජන සහ වත්කම් සුරක්ෂිත භාවය තහවුරු කර ඇත. තවද අභ්‍යන්තර පාලන ක්‍රම වල පවතින ආවේණික අඩුපාඩු හේතුකොටගෙන ඇතිවන වැරදි සහ වංචා සම්බන්ධව කොමසාරිස් මණ්ඩලය දැණුවත් වී ඇත.

අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධව කලින් කල සිදුකරණ විමර්ශන

කොමසාරිස් වරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් විසින් සිදුකරන විමර්ෂණ ඇසුරින් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් භාවය සහ සඵල තාවය සම්බන්ධ නිරීක්ෂණ පාලක මණ්ඩලයට යොමුකරන අතර පාලක මණ්ඩලය මගින් නියමිත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය

පාලක මණ්ඩල කොමසාරිස්වරුන් විසින් ආයතනයේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) වලට අනුකූලව සකස්කර ඇති බවට සහතික කරන අතරමූල්‍ය ප්‍රකාශ වාර්තාකරණය දැනට පවතින අදාළ නීති සහ ක්‍රියාත්මක භාවයන්ට අනුකූලව සිදු කර ඇත. එමෙන්ම මූල්‍ය ප්‍රකාශ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් විගණනය කර ඇති බවටද සහතික කරයි.

අඛණ්ඩ පැවැත්ම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල නියමිත ද්‍රවශීලතා තත්වයන් යටතේ එහි ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබේ.

ව්‍යවස්ථාපිත බැඳීම්

කොමසාරිස් වරුන් විසින් ඔවුන්ගේ දැණුම සහ විශ්වාසයට අනුව රජයට ඇති මූල්‍යමය බැඳීම් හා ව්‍යවස්ථාමය වශයෙන් සේවකයන්ට ඇති බැඳීම් සඳහා නියමිත ගෙවීම් කර ඇති බව හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල සලසා ඇති බව සම්බන්ධයෙන් සෑහීමකට පත්වේ.

අනෙකුත් පාර්ශවයන් සමග ඇති සම්බන්ධතාවය

සේවකයන්

පාලක මණ්ඩලය විසින් සම්පාදිත ආයතනයේ දැක්ම, අරමුණු සහ පරමාර්ථ සම්බන්ධව ආයතනයේ සියළුම නිලධාරීන් දැනුවත් වී ඇත. අවම වයස් සීමාවට අඩු කිසිම පුද්ගලයෙකුට ආයතනයේ රැකියා අවස්ථා සලසා නොමැත. ආයතනයේ රැකියා අවස්ථා සහ උසස්වීම් සඳහා ජාතිය, ලිංගභේදය ආදී වෙනස්කම් සැලකිල්ලට භාජනය නොකෙරේ.

නියාමන ආයතන

මහා භාණ්ඩාගාරය, අදාළ අමාත්‍යාංශය සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමග අර්ථවත් සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සම්බන්ධව පාලක මණ්ඩලය සහතික වී ඇත. ආයතනයේ පැවැත්ම සහ ක්‍රියාකාරිත්වය අදාළ ආයතන මගින් නිකුත් කරන නීති සහ නියෝග නිසි පිළිපැදීම මගින් සහ රටේ පවතින නීතිවලට අනුකූලතාව දැක්වීමෙන් සාක්ෂාත් වී ඇත.

පරිසරය

ආයතනය සහ නිලධාරීන් පිළිගත් සම්මත උපයෝගීකරගැනීම මගින් පරිසර පද්ධතිය මනා ලෙස පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් විශේෂ සැලකිල්ල යොමු කොට ඇත.

මෙහෙයුම් සහ මූල්‍ය විග්‍රහය

2014 වර්ෂයේ කාර්යසාධනය

2014 වර්ෂයේදී පළාත් පාලන ආයතන වෙත ණය දීම සඳහා රු.මි.600 ක මුදලක් ඇස්තමේන්තු ගතකර තිබුණි. වර්ෂය තුලදී පළාත් පාලන ආයතන 34 ක් වෙත නිකුත්කළ මුළු ණය වටිනාකම රු.මි.303 කි. පළාත් පාලන ආයතන වෙත ණය නිකුත්කිරීම ප්‍රතිශතයක් ලෙස ගත්කළ 50% කි. මෙම ණය මුදල් සහනදායී පොළී ප්‍රතිශතයක් මත වසර 5 -10 කින් ආපසු ගෙවිය යුතුවේ.

2014 වර්ෂය තුලදී ණය නිකුත් කිරීමේ සාරාංශය පහත දැක්වේ;

	ව්‍යාපෘති වර්ගය	පොළී ප්‍රතිශතය (වාර්ෂික)	මුදල (රු.)	ව්‍යාපෘති සංඛ්‍යාව
1	මාර්ග නඩත්තු ඒකක පිහිටුවීම	9.0%	86,415,000	08
2	ආදාහනාගාර ඉදිකිරීම	6.5%	63,400,000	11
3	පොදු වෙළඳපළ ඉදිකිරීම	9.0%	90,192,730	06
4	සතිපොළ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති	6.5%	47,575,000	04
5	ට්‍රැක්ටර් මිලදීගැනීම	9.0%	3,000,000	01
6	ඩබල් කැබ් මිලදීගැනීම	9.0%	6,000,000	01
7	පානීය ජල ව්‍යාපෘති	7.0%	5,000,000	01
8	වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති	9.0%	1,810,000	02
	එකතුව		**303,392,730**	**34**

ආදායම

උපයාගන්නා ලද දළ ආදායම රු.මි.164 කි (ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති මගින් නිකුත්කළ ණය මුදල් ද ඇතුළුව). ඊට අමතරව රාජ්‍ය බැංකුවල වත්‍රීය අරමුදල් ආයෝජනය කිරීමෙන් රු.මි.18.9 ක් ද උපයාගෙන ඇත. ආයතනයේ පරිපාලන වියදම් සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වලට ලබාදී ඇති ප්‍රදානයන් වෙන් කිරීමෙන් පසු ශුද්ධ අලාභය රු.මි.56 කි. (පොත්වලින් ගැලපූ ප්‍රදාන කොටස රුපියල් මිලියන 195 කි) තවද 2014 වර්ෂයේ ගණනය කරන ලද ණය හානිකරණයේ අගය රු.මි.96 කි. ඒ අනුව බදු පෙර අලාභය රු.මි.134 කි.

2014 වර්ෂය තුල පොළී ආදායම, ආයෝජන ආදායම සහ මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම (ව්‍යාපෘති අනුව)

(රු.මි)

	LLDF	PCDP	UDLIHP	LGIIP	මුළු එකතුව
පොළී ආදායම	54.4	5.9	120.5	142.7	323.5
මහා භාණ්ඩාගාරයට පොළී ගෙවීම්	18.6	5.2	100.1	35.5	159.4

2014 වර්ෂය තුල ආයෝජන ආදායම් පහතින් දැක්වේ

(රු.මි)

	LLDF	PCDP	UDLIHP	LGIIP	මුළු එකතුව
භාණ්ඩාගාර බිල්පත්	0.8	-	2.6	0.9	4.3
ස්ථාවර තැන්පතු පොළී	2.2	-	4.8	0.09	7.09
අරමුදල් කළමනාකරණ ගිණුම	0.9	-	2.4	3.9	7.2
එකතුව	3.9	-	9.8	4.89	18.59

පසුගිය වර්ෂ 05 ක දළ ආදායම - 2010 - 2014

(රු.මි)

වර්ෂය	බදු ගෙවීමට පෙර දළ ලාභය (රුපියල් මිලියන)
2010	11.0
2011	-47.0
2012	(335.4)
2013	(246.4)
2014	(134.1)

භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්

2014 වර්ෂය තුලදී දේශීය අරමුදල් සඳහා ණය වාරික සහ පොළී මුදල් වශයෙන් පිළිවෙලින් රු.මි.22.5 ක් සහ රු.මි.18.6 ක් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ රු.මි.90.8 ක් ණය වාරික වශයෙන් ද රු.මි.100 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.35.5 ක් පොළී වශයෙන් ද මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවා ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මි.3.8 ක් ණය වාරික වශයෙන් ද රු.මි.5.2 ක් පොළී වශයෙන් ද ආපසු ගෙවා ඇත.

(රු.මි)

	වාරික ගෙවීම්	පොළී ගෙවීම්	එකතුව
LLDF	22.5	18.6	41.1
PCDP	3.8	5.2	9.0
UDLIHP	90.8	100.0	190.8
LGIIP	-	35.5	35.5
එකතුව	117.1	159.3	276.4

ණය ආපසු අයකිරීම

වර්ෂය තුලදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ චක්‍රීය අරමුදල් වලින් ලබාදුන් ණය වලින් ණය වාරික වශයෙන් රු.මි.130.0 ක් ද පොළී මුදල් වශයෙන් රු.මි.53.6 ක් ද පළාත් පාලන ආයතනයන්ගෙන් ආපසු අයකරගෙන ඇත. නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය තුලින් රු.මි.89.6 ක් ණය වාරික වශයෙන් ද රු.මි.80.0 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත. තවද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය තුලින් රු.මි.1.5 ක් ණය වාරික වශයෙන් ද රු.මි. 7.3 ක් පොළී වශයෙන් ද අයකරගෙන ඇත.පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.මි.116.2 ක් වාරික වශයෙන්ද රු.මි. 143.2 ක් පොළී වශයෙන් ද ආපසු අයකරගෙන ඇත.

(රු.මි)

	වාරික අයකිරීම්	පොළී අයකිරීම්	එකතුව
LLDF	130.0	53.6	183.6
PCDP	1.5	7.3	8.8
UDLIHP	89.6	80.0	169.6
LGIIP	116.2	143.2	259.4
එකතුව	337.3	284.1	621.4

ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති

<u>ආසියානු සංවර්ධන බැංකු ණය අංක1632 SRI (SF) - (UDLIHP)</u>
<u>නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය</u>

නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ ඉහත ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය ආපසු අය කර ගැනීමේ ආයතනය වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදල කටයුතු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන 27 ක් සඳහා නිකුත්කළ ණය වල වටිනාකම රු.මි.2,270 ක් වේ. මෙම ව්‍යාපෘති අතුරින් 70% ක ණය අයකිරීම් කරගෙන යනු ලබන අතර ඉතිරි ව්‍යාපෘති වල ණය ආපසු අයකිරීමේ ගැටළු පැන නැගී ඇත. මීට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ මෙම ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද වෙළඳ සංකීර්ණ අසාර්ථක වීමත් අනෙකුත් ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් ද විවිධ ගැටළු පැනනැගී ඇති වීමත්ය.

පසුගිය වසර 05 ක ණය අයකිරීමේ ප්‍රගතිය (UDLIHP)

(රු.මි)

වර්ෂය	ණය වාරික අයකිරීම්	පොළී අයකිරීම්
2010	62.1	93.6
2011	71.7	102.4
2012	76.6	93.5
2013	82.4	90.3
2014	89.6	80.0

<u>ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF)</u>
<u>පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය</u>

ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) දරණ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයත වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා 2006 ජනවාරි මස ආසියානු සංවර්ධන බැංකුව සහ දේශීය ණය සහ සංවර්ධන අරමුදල අතර ව්‍යාපෘති ගිවිසුම අත්සන් කරන ලදී. ඉහත ව්‍යාපෘතිය යටතේ නාගරික යටිතල පහසුකම් සහ මූලික නාගරික සේවා වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීමේ කාර්යයන් ඇතුලත් වේ. ඒ යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් හඳුනාගෙන ඇත.

1. ග්‍රාමීය ජල සම්පාදනය
2. පළාත් පාලන ආයතන වලට අයත් මාර්ග සංවර්ධනය
3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
4. නාගරික ජලාපවහන සහ මළාපවහන පද්ධතිය සංවර්ධනය
5. කුඩා පරිමාණ ප්‍රජා යටිතල පහසුකම් (මූලික සෞඛ්‍ය සායන හා පුස්තකාල ආදිය)

උක්ත ව්‍යාපෘතිය මෙහෙයවනු ලබන්නේ පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය මගින් වන අතර පළාත් පාලන ආයතන වෙත ණය නිකුත් කිරීම සහ එම ණය ආපසු අයකරගැනීමේ කාර්යය දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. මේ සඳහා වෙන් කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි. මෙය 100% ක ණය මුදලක් වශයෙන් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර වසර 08ක සහන කාලයක් සමග වසර 32 කින් මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. සහන කාලය තුලදී පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5% කි.

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත ලබාදෙන ව්‍යාපෘති සඳහා ණය සහ ප්‍රදාන වශයෙන් කොටස් 02 කි. පළාත් පාලන ආයතන වල වර්ගීකරණය අනුව ණය මුදල 33% සිට 53% දක්වා වන අතර ප්‍රදානය 40% සිට 60% දක්වා වේ. යටකී ප්‍රදානය දැරිය යුතුව ඇත්තේ ණය සඳහා වන 9% ක පොළී මුදලිනි. මේ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල ඉතා විශාල අවදානමක් දැරිය යුතුව ඇත.

උප ව්‍යාපෘති ශක්‍යතාවය පළාත් පාලන ආයතනවල ඉදිරි ආදායම් මත නිගමනය වේ. මූල්‍ය සහ පළාත් පාලන ක්‍රියාකාරී සැලැස්ම සහ හැකියා වර්ධන ක්‍රියාකාරකම් අත්‍යවශ්‍ය අංග වන අතර එම අංග ක්‍රියාත්මක වීම මගින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ණය අයකරගැනීම සුරක්ෂිතතාවය සහතික වන අතරම ණය පැහැර හැරීමේ අවදානම අඩුවේ. ඒ අතරම ණය ආපසු ගෙවීම් නිසි පරිදි සිදුවීමට පළාත් පාලන ආයතන වල මූල්‍ය තත්වය ශක්තිමත් හා තිරසර විය යුතුය. එමෙන්ම අරමුදලෙන් නැවත ණය ලබාගැනීම සඳහා එකී ශක්‍යතාවය වැදගත්වේ. පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියෙහි අරමුණ ඉහත පරිදි වේ.

විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව
2014 වර්ෂය

2005.07.01 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පී.ඊ.ඩී./31 ප්‍රකාර දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ කොමසාරිස් මණ්ඩලය විසින් විගණන හා කළමනාකරණ කමිටුව පත්කර ඇත. විධායක නොවන අධ්‍යක්ෂවරයන් දෙදෙනෙක් සහ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකද ඇතුලත් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ. කොමසාරිස් මණ්ඩලය නියෝජනය කරන භාණ්ඩාගාර නියෝජිත, එහි සභාපති ලෙස ද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත නිරීක්ෂක වශයෙන් ද සහභාගී වේ. ප්‍රධාන විධායක නිලධාරී කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ.

(01) 2012 සහ 2013 වර්ෂවල මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිම

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති උපදෙස් පරිදි 2012 සහ 2013 වර්ෂවල අවසාන ගිණුම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී කා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුව පිළියෙල කිරීම සඳහා පළපුරුදු වෘත්තීක ගණකාධිකරණ ආයතනයක් මගින් සිදුකරගැනීම වඩාත් යෝග්‍ය බවට උපදෙස් ලබාදීම සහ එම මූල්‍ය ප්‍රකාශ කඩිනමින් ලබාගෙන විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබාදීම.

(02) කාර්යමණ්ඩලය පුහුණු කිරීම

නව ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා ආයතනයේ කාර්යමණ්ඩලය පුහුණු කරවන ලෙස උපදෙස් ලබාදීම.

(03) 2014 වර්ෂයේ සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

ආයතනයේ 2014 වර්ෂයට අදාළ සංයුත්ක සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

(04) විගණකාධිපති වාර්තා තුලින් පැනනැගුණු කරුණු සමාලෝචනය

2011 වර්ෂයට අදාළ විගණන වාර්තාව සමාලෝචනය කරනු ලැබූ අතර, එමගින් පැන නැගී ඇති කරුණු නිවැරදි කිරිමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා ආයතනය යොමුකරවනු ලැබීය. විශේෂයෙන්,

අ) අක්‍රිය ණය (අය නොවන ණය)

ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) - 899 SRI (SF) සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP) - 1632 SRI (SF).

මෙම ව්‍යාපෘති මගින් ලබාදී ආපසු නොගෙවන ණය සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත්කරන ලද හිඟ ණය අයකිරීමේ උප කමිටු ක්‍රියාකාරීත්වය ඇගයීමට ලක්කරන ලද අතර ඒවා තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදී පසුවිපරම් ක්‍රියාවළියක් තුලින් ප්‍රගතිය ඇගයීම.

තවද ණය ගෙවීම පැහැරහැර ඇති පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් එම පළාත් පාලන ආයතන කැඳවා සාකච්ඡාකර එම ආයතන සමග එකඟතාවයකට පැමිණ ණය මුදල් ප්‍රතිව්‍යුහගතකර අයකිරීම සඳහා උපදෙස් ලබාදීම.

ආ) උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතන වල හිඟ ණය

1980 වර්ෂයට පෙරදී උතුරු නැගෙනහිර පළාතේ පළාත් පාලන ආයතන වෙත ලබාදී ඇති ණය මුදල් උතුරු නැගෙනහිර පළාතේ පැවති යුධමය වාතාවරණය හේතුකොටගෙන වසර 30 කට අධික කාලයක් ණය අය අයකිරීමේ ගැටළු පැනනැගී පැවතුණි. එම ණය අයකිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් වරයා සමග දීර්ඝලෙස සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම හිඟ මුදල් අයකිරීමට හැකියාව ලැබී ඇත.

(05) හිඟ ණය අයකිරීම

විදේශ ව්‍යාපෘති හරහා ණය මුදල් ලබාදී ඇති හිඟ ණය පිළිබඳව සහ එහි වර්තමාන තත්වය පිළිබඳ වාර්තාවක් මහාභාණ්ඩාගාර ලේකම්වරයාවෙත ලබාදීමට කටයුතුකරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

(06) පළාත් පාලන ආයතන සමග අත්සන් කරනු ලබන ගිවිසුම්පත් සංශෝධනය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් පළාත් පාලන ආයතන වෙත නිකුත් කරනු ලබන ණය මුදල් සම්බන්ධයෙන් ලබාගන්නා සුරැකුම්පත් ශක්තිමත් කිරීම. උදා - ණය වාරික නිසිපරිදි අයකර ගැනීමට අරමුදලට බලය ලැබෙන අයුරු අවලංගු කළ නොහැකි නිත්‍ය නියෝගයක් බැංකුවෙන් තහවුරු කර ලබාගැනීම.

(07) පරිගණක මෘදුකාංග පද්ධතිය

ආයතනයට ගැලපෙන අයුරින් කළමනාකරණ තීරණ ගැනීම සඳහා අවශ්‍ය සියළුම තොරතුරු ලබාගත හැකි විධිමත් පරිගණක මෘදුකාංග වැඩසටහනක අවශ්‍යතාවය කමිටුව විසින් හඳුනාගෙන තිබුණි. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ආයතන ශක්තිය වැඩිදියුණු කිරීමේ අරමුණින් (LL&DF Strengthening) පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය මගින් අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ඒ සඳහා ලබාදී ඇත. කෙසේ වෙතත් පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමේදී ගැටළු රාශියක් පැනනැගී ඇත. එම ගැටළු නිරාකරණය කරගැනීම සහ සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

(08) ආසියානු සංවර්ධන බැංකු ණය අංක 2201 SRI (SF) - පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන වෙත නිකුත් කරන ණය ආපසු අයකරගැනීමේ කාර්යය ව්‍යාපෘතියේ කාණ්ඩ “බී” යටතේ දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. වෙන්කරන ලද මුළු මුදල ඇමරිකානු ඩොලර් මිලියන 42.5 කි (SDR 24.6 million) මෙය 100% ක ණය මුදලක් වශයෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අතර මහා භාණ්ඩාගාරය වෙත නැවත ගෙවිය යුතුය. වසර 8 ක පොළී අනුපාතය 1% ක් වන අතර සහන කාලයෙන් පසු 1.5%කි.

මෙම ව්‍යාපෘතිය යටතේ ණය ආපසු අයකරගැනීම දේශීය ණය සහ සංවර්ධන අරමුදල වෙත පැවරී ඇත. එම සමස්ථ මුදල වන රු.මි.4,429 ක මුදලින් ණය වශයෙන් ආපසු අයකරගතහැකි වන්නේ රු.මි.1,721 කි. ඉතිරිය ප්‍රදාන වේ.

(09) අභ්‍යන්තර විගණන වාර්තා - 2012

2012 වර්ෂයේ අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කරනු ලැබූ අතර, එමගින් පැන නැගී ඇති කරුණු නිවැරදි කිරිමට ගතයුතු ක්‍රියාමාර්ග සඳහා ආයතනය යොමුකරවනු ලැබීය. විශේෂයෙන්

(10) ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කිරීම

හිඟ ණය වාරික සහ පොළී අයකරගැනීමට අදාළ ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කිරීම ප්‍රමාදවී ඇත්තේ කාර්යයමණ්ඩලයේ හිඟයක් පැවතීම බැවි නිරීක්ෂණය විය. ඒ අනුව කාර්යය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින තනතුරු සඳහා කඩිනමින් බඳවාගැනීම් සිදුකර අදාළ ලෙජර් ගිණුම් යාවත්කාලීන කිරීමට උපදෙස් ලබාදෙන ලදී.

(11) භාණ්ඩ සමීක්ෂණය

2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය කඩිනමින් සිදුකර එම වාර්තාව අභ්‍යන්තර විගණක වෙත කඩිනමින් ලබාදීමට කටයුතු කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී.

2014 වර්ෂයේ කමිටු සාමාජිකයින්

එන්.කුලසේකර මහතා	භාණ්ඩාගාර නියෝජනය	සභාපති
වජිර ස්වර්ණ ශ්‍රී බණ්ඩාර මහතා	ගරු අමාත්‍යතුමා විසින් පත්කරන ලද	සාමාජික
ආර්.එම්.ධර්මලතා මහත්මිය	අභ්‍යන්තර විගණක (පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය)	සාමාජික
ඊ.ඒ.එන්.පී.එදිරිසිංහ මහත්මිය	විගණකාධිපති දෙපාර්තමේන්තුව	නිරීක්ෂක

මූල්‍ය ප්‍රකාශ හා තොරතුරු

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය

(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

2014-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් වියදම් ගිණුම

	සටහන්	2014 රු. ශත.	2013 රු. ශත.
ආදායම			
පොළී ආදායම	19	323,611,441.91	299,820,521.28
භාණ්ඩාගාර ණය පොළී	20	(159,448,822.07)	(168,193,753.27)
දළ ආදායම		**164,162,619.84**	**131,626,768.01**
වෙනත් ආදායම්	21	670,316.06	7,546,955.58
පරිපාලන වියදම්	22	(25,991,061.44)	(17,249,939.09)
පළාත් පාලන ආයතන වෙත විශේෂ ප්‍රදාන	23	(195,102,503.09)	(250,162,653.18)
මෙහෙයුම් අලාභය		**(56,260,628.63)**	**(128,238,868.68)**
ණය හානිකරණය සහ අනෙකුත් අලාභයන්		(98,819,054.65)	(145,038,356.40)
මූල්‍ය වියදම්		-	-
මූල්‍ය ආදායම	24	18,966,702.40	26,821,303.43
බදු ගෙවීමට පෙර අලාභය		**(134,112,980.88)**	**(246,455,921.65)**
ආදායම් බදු ගෙවීම්		(1,300,000.00)	(1,800,000.00)
ආදායම් බදු වෙන්කිරීම්		-	-
බදු ගෙවීමෙන් පසු අලාභය		**(135,412,980.88)**	**(248,255,921.65)**
ඒකාබද්ධ අරමුදලට ගෙවීම්		-	-
ශුද්ධ ලාභය		(135,412,980.88)	(248,255,921.65)
වර්ෂ ආරම්භයේ රඳවාගත් ඉපැයුම්		(804,339,321.21)	(556,083,399.56)
වර්ෂ අවසානයේ රඳවාගත් ඉපැයුම්		**(939,752,302.09)**	**(804,339,321.21)**

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය

(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)

2014-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්	2014 (රු.)	2013 (රු.)
වත්කම්			
දිගුකාලීන වත්කම්			
ස්ථාවර වත්කම් සහ යන්ත්‍රෝපකරණ	1	18,752,097.50	2,848,978.70
මූල්‍ය වත්කම් ආයෝජන කල්පිරීම්	2	296,085,567.43	295,543,011.38
ප්‍රදානයන් - ප.පා.ය.ප.වැ.ව	3	1,527,466,141.02	1,846,373,896.45
සේවක ණය	4	4,132,682.51	3,255,199.51
මුළු දිගුකාලීන වත්කම්		**1,846,436,488.46**	**2,148,021,086.04**
ජංගම වත්කම්			
ණය ගැතියෝ	5	3,350,479,316.58	3,482,315,093.62
ලැබිය යුතු ණය පොළී	6	195,286,932.80	149,934,571.46
ආපසු ලබාගතහැකි තැන්පතු		40,051.61	40,051.61
ලැබිය යුතු ආයෝජන ආදායම් (UDLIHP)	7	2,522,742.00	2,522,742.00
අවිනිශ්චිත ගිණුම - ප.පා.ය.ප.වැ.ව		199,054.38	-
මූල්‍ය ශේෂය (PMU)		19,500,745.64	19,500,745.64
මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය	8	78,105,724.11	177,750,550.48
මුළු ජංගම වත්කම්		**3,646,134,567.12**	**3,832,063,754.81**
මුළු වත්කම්		**5,492,571,055.58**	**5,980,084,840.85**
වගකීම්			
රඳවාගත් ඉපැයුම්	9	(939,752,302.09)	(804,339,321.21)
මුළු සමකොටස්		(939,752,302.09)	(804,339,321.21)

වගකීම්			
දිගුකාලීන වගකීම්			
භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය	10	2,119,104,945.05	2,236,290,786.87
ගෙවිය යුතු ණය - ප.පා.ය.ප.වැ.ව	11	3,551,530,832.49	3,551,530,832.49
ප්‍රදානයන් - ප.පා.ය.ප.වැ.ව	12	596,055,986.27	760,524,537.95
පාරිතෝෂික සඳහා වෙන්කිරීම	13	2,348,607.37	1,782,690.29
ගෙවිය යුතු රඳවාගැනීම්		-	-
රාජ්‍ය අනුග්‍රහය (ප්‍රාග්ධන) - ප.පා.ය.ප.වැ.ව	14	6,075,231.07	6,075,231.07
මුළු දිගුකාලීන වගකීම්		**6,275,115,602.25**	**6,556,204,078.67**
ජංගම වගකීම්			
භාණ්ඩාගාරය සඳහා ගෙවිය යුතු පොළී	15	117,095,176.89	187,095,177.09
අවිනිශ්චිත පොළී ලැබීම්		-	-
උපචිත වියදම් වෙන්කිරීම්	16	9,043,144.92	7,980,439.00
පෙර වර්ෂය සඳහා ලැබීම්	17	10,990,972.47	11,744,499.58
බදු වගකීම	18	577,715.50	1,899,222.08
ජංගම වගකීම් - ප.පා.ය.ප.වැ.ව		19,500,445.64	19,500,445.64
මුළු ජංගම වගකීම්		**157,207,755.42**	**228,220,083.39**
මුළු වගකීම්		**5,492,571,055.58**	**5,980,084,840.85**

එච්.ටී.කේ.පත්මසිරි
සභාපති
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(ලේකම් - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය)

ඩබ්.එම්.එම්.බී.එච්.ගුණරත්න
භාණ්ඩාගාර නියෝජිත
කොමසාරිස් මණ්ඩලය
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(අධ්‍යක්ෂ - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව)

එස්.ඒ.එන්.ආර්.සුභසිංහ
ප්‍රධාන විධායක නිලධාරී
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
(දේශීය ණය සහ සංවර්ධන අරමුදල)
2014/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

	2014 (රු.)	2013 (රු.)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
බදු ගෙවීමට පෙර ලාභය	(134,112,980.88)	(246,455,921.65)
එකතුකිරීම්		
පොළී ගෙවීම්	-	-
පොළී ලැබීම්	(18,966,702.40)	(26,821,303.43)
ක්ෂය වෙන්කිරීම්	2,245,807.60	1,200,083.50
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	565,917.08	338,722.29
පෙර වර්ෂය සඳහා ගැලපීම්	-	-
අවිනිශ්චිත ගිණුම	(199,054.38)	559,414.61
කාරක ප්‍රාග්ධනයේ ගැලපීමට පෙර මෙහෙයුම් ලාභය	**(150,467,012.98)**	**(271,179,004.68)**
අඩුවීම / වැඩිවීම - ණය ගැතියෝ	86,483,415.70	133,155,637.37
අඩුවීම / වැඩිවීම - ප්‍රධාන - ප.පා.ය.ප.වැ.ව	318,907,755.43	208,211,076.72
අඩුවීම / වැඩිවීම - පෙර වර්ෂය සඳහා ලැබීම්	(753,527.11)	8,832,547.04
අඩුවීම / වැඩිවීම - සේවක ණය ගැතියෝ	(877,483.00)	(575,534.49)
අඩුවීම / වැඩිවීම - භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය පොළී	(70,000,000.20)	187,095,177.09
අඩුවීම / වැඩිවීම - වෙළඳ ණය ගැතියෝ සහ වෙනත් ගෙවීම්	1,062,705.92	1,005,621.69
අඩුවීම / වැඩිවීම - ලැබීම්	(117,185,841.82)	(126,173,176.29)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්	**67,170,011.94**	**140,372,344.45**
භාණ්ඩාගාරයට පොළී ගෙවීම්	-	-
පොළී ලැබීම්	18,966,702.40	26,821,303.43
රඳවාගැනීම් බදු	(1,280,876.65)	(1,335,786.00)
ආදායම් බදු ගෙවීම්	(1,340,629.93)	(1,407,663.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් මත ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්	**83,515,207.76**	**164,450,198.88**
ආයෝජන ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
ස්ථාවර වත්කම් සහ යන්ත්‍රෝපකරණ	(18,148,926.40)	(49,500.00)
ස්ථාවර වත්කම් බැහැර කිරීම	-	-
ස්ථාවර තැන්පතු	-	(10,000,000.00)
භණ්ඩාගාර බිල්පත්	(542,556.05)	-
ආයෝජන ක්‍රියාකාරකම් මත ශුද්ධ මූල්‍ය ප්‍රවාහයන්	**(18,691,482.45)**	**(10,049,500.00)**
මූල්‍ය ක්‍රියාකාරකම් මත මුදල් ප්‍රවාහයන්		
ණය නිකුත්කිරීම්	-	1,425,354.54
ණය අයකිරීම්	(164,468,551.68)	(37,099,247.40)
මූල්‍ය ක්‍රියාකාරකම් මත ශුද්ධ මුදල් ප්‍රවාහයන්	**(164,468,551.68)**	**(35,673,892.86)**
අඩුවීම / වැඩිවීම - වර්ෂය තුල වූ මූල්‍ය විචල්‍යයන්	**(99,644,826.37)**	**118,726,806.02**
වර්ෂය ආරම්භයේ වූ මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය (සටහන A)	**197,251,296.12**	**78,524,490.10**
වර්ෂය අවසානයේ වූ මූල්‍ය විචල්‍යන්ගේ ශේෂය (සටහන A)	**97,606,469.75**	**197,251,296.12**

සටහන A

මූල්‍ය විචලයයන්	**2014 Rs. Cts.**	**2013 Rs. Cts.**
ඉතිරි කිරීමේ ගිණුම	99,097,476.70	165,666,792.55
මුදල් ශේෂය PMU	19,500,745.64	19,500,745.64
බැංකුවේ ඇති මුදල්	(20,991,752.59)	12,083,757.93
වර්ෂය අවසානයේ වූ මූල්‍ය විචල්‍යයන්ගේ ශේෂය	**97,606,469.75**	**197,251,296.12**

දේශීය ණය සහ සංවර්ධන කොමසාරිස් මණ්ඩලය
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

ශේෂ පත්‍රය සඳහා සටහන්

2014/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

1 **ස්ථාවර වත්කම්**

පිරිවැය

විස්තරය	**01.01.2014 දිනට පිරිවැය**	**එකතු කිරීම්/ බැහැරකිරීම්**	**31.12.2014 දිනට පිරිවැය**
කාර්යාල ගොඩනැගිලි	2,056,196.16	137,985.50	2,243,681.66
ගෘහභාණ්ඩ සහ උපකරණ	606,563.15	4,544,309.47	5,150,872.62
පරිගණක දෘඩාංග, මෘදුකාංග සහ කාර්යාල උපකරණ	4,546,364.00	2,349,238.00	6,895,602.00
වත්කම් - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	1,389,013.55	3,122,393.43	4,511,406.98
මෝටර් රථ - නිසාන් Xtrail	-	7,995,000.00	7,995,000.00
එකතුව	**8,647,636.86**	**18,148,926.40**	**26,796,563.26**

සමුච්චිත ක්ෂයවෙන්කිරීම්

විස්තරය	**01.01.2014 දිනට ශේෂය**	**අදාළ වර්ෂය සඳහා ක්ෂය**	**31.12.2014 දිනට ශේෂය**
කාර්යාල ගොඩනැගිලි	1,897,254.87	82,899.06	1,980,153.93
ගෘහභාණ්ඩ සහ උපකරණ	118,490.89	1,051,169.20	1,169,660.09
පරිගණක දෘඩාංග, මෘදුකාංග සහ කාර්යාල උපකරණ	1,854,137.35	-	1,854,137.35
වත්කම් - ව්‍යාපෘති කළමනාකරණ ඒකකය	1,928,775.05	312,239.34	2,241,014.39
මෝටර් රථ - නිසාන් Xtrail	-	799,500.00	799,500.00
එකතුව	**5,798,658.16**	**2,245,807.60**	**8,044,465.76**

ලියා හරින ලද අගය	**2,848,978.70**		**18,752,097.50**

02	මූල්‍ය වත්කම් - ආයෝජන කල්පිරීම්	2014	2013
	ස්ථාවර තැන්පතු	236,855,292.05	236,855,292.05
	භාණ්ඩාගාර බිල්පත්	59,230,275.38	58,687,719.33
		296,085,567.43	**295,543,011.38**

03	පළාත් පාලන ආයතන වෙත ලබාදු ප්‍රදාන (ප.පා.ය.ප.වැ.කි.ව)	2014	2013
	2014 වර්ෂයේදී ප. පා. ආයතන වෙත ලබාදුන් ප්‍රදාන	2,841,795,121.45	2,841,795,121.45
	අඩුකලා - ප්‍රදාන (2014 ක්‍රමක්ෂය)	(1,314,328,980.43)	(995,421,225.00)
		1,527,466,141.02	**1,846,373,896.45**

04	සේවක ණය	2014	2013
	ආපදා ණය	4,098,682.51	3,232,199.51
	උත්සව අත්තිකාරම්	34,000.00	23,000.00
		4,132,682.51	**3,255,199.51**

05	දිගුකාලීන වත්කම් - ණය ගැතියෝ	2014	2013
	දේ.ණ.ස.අ (ම.න.ස, න.ස සහ ප්‍රා.ස)	792,304,472.38	619,124,948.12
	නා. සං. සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	1,616,213,801.13	1,706,194,130.12
	ප. පා. ය.ප. වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	1,619,525,855.00	1,735,734,362.20
	බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය	67,847,622.91	69,356,658.37
	ජාතික ජල සම්පාදන සහ ජලා පවාහණ මණ්ඩලය	8,717,505.22	9,215,880.22
		4,104,609,256.64	**4,139,625,979.03**
	අඩු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්		
	2014.01.01 දිනට ශේෂය	657,310,885.41	512,272,529.01
	එකතු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්	96,819,054.65	145,038,356.40
		754,129,940.06	**657,310,885.41**
	2014.12.31 දිනට ශේෂය	**3,350,479,316.58**	**3,482,315,093.62**

6	ලැබිය යුතු පොළී - දිගුකාලීන	2014	2013
	ලැබිය යුතු ණය පොළී - LLDF	24,350,084.30	19,478,744.99
	ලැබිය යුතු පොළී - UDLIHP	95,143,335.83	55,524,443.20
	ලැබිය යුතු පොළී - PCDP	-	-
	ලැබිය යුතු පොළී - LGIIP	74,750,247.63	74,931,383.27
	භාණ්ඩාගාරයෙන් ලාබිය යුතු පොළී - LGIIP	-	-
	ලැබිය යුතු ප්‍රමාණීකෘත වන්දි - LGIIP	1,043,265.04	-
	ලැබිය යුතු අමතර පොළී - LGIIP	-	-
	ජා.ජ.ස. සහ ජලාපවහන මණ්ඩලය	-	-
		195,286,932.80	**149,934,571.46**

අක්‍රිය ණය - LL&DF	-	-
අක්‍රිය ණය - PCDP	-	-
අක්‍රිය ණය - UDLIHP	-	-
	195,286,932.80	**149,934,571.46**

7 ලැබිය යුතු ආයෝජන ආදායම් - UDLIHP	2014	2013
ලැබිය යුතු පොළී (භාණ්ඩාගාර බිල්පත්) - UDLIHP	1,306,001.00	1,306,001.00
ලැබිය යුතු පොළී (ස්ථාවර තැන්පතු) - UDLIHP	1,216,741.00	1,216,741.00
	2,522,742.00	**2,522,742.00**

8 මූල්‍ය විචලනයන්	2014	2013
ඉතිරිකිරීමේ ගිණුම	99,097,476.70	165,666,792.55
අතැති මුදල්	(20,991,752.59)	12,083,757.93
	78,105,724.11	177,750,550.48

9 රදවාගත් ඉපැයුම්	2014	2013
2014.01.01 දිනට ශේෂය	(804,339,321.21)	(556,083,399.56)
2014 වර්ෂය සඳහා	(135,412,980.88)	(248,255,921.65)
	(939,752,302.09)	(804,339,321.21)

10 භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය	2014	2013
භාණ්ඩාගාර ණය අරමුදල්	231,393,165.24	259,968,955.24
නා.ස.අ.ආ.නි.ව	1,815,794,838.96	1,906,599,867.55
බහු.හෝ.සං.ව්‍යා	65,916,940.85	69,721,964.08
	2,119,104,945.05	2,236,290,786.87

11 භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය	2014	2013
ප.පා.ය.ප.වැ.ව	3,551,530,832.49	3,551,530,832.49
	3,551,530,832.49	3,551,530,832.49

12	පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන - ප.පා.ය.ප.වැ.ව	2014	2013
	ප්‍රදාන - ලැබීම්	1,102,964,884.09	1,102,964,884.09
	අඩුකළා - 2014 ප්‍රදාන ක්‍රමක්ෂය	(506,908,897.82)	(342,440,346.14)
		596,055,986.27	760,524,537.95

13	පාරිතෝෂික ගෙවීම්	2014	2013
	පාරිතෝෂික වෙන්කිරීම්	1,782,690.29	1,443,968.00
	වර්ෂය සඳහා වෙන්කිරීම්	565,917.08	338,722.29
		2,348,607.37	1,782,690.29
	වර්ෂය සඳහා පාරිතෝෂික ගෙවීම්	-	-
		2,348,607.37	1,782,690.29

14	මහා භාණ්ඩාගාරයෙන් ලැබීම් වාරික - ප.පා.ය.ප.වැ.ව	2014	2013
	වත්කම් - LGIIP (පිරිවැය)	7,500,110.62	7,500,110.62
	අඩුකළා - භාණ්ඩාගාරයෙන් ලැබීම් (ක්‍රමක්ෂය)	(1,424,879.55)	(1,424,879.55)
		6,075,231.07	6,075,231.07

15	මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු පොළී	2014	2013
	ගෙවිය යුතු පොළී UDLIHP	117,095,176.89	187,095,177.09
	ගෙවිය යුතු පොළී PCDP	-	-
	ගෙවිය යුතු පොළී LGIIP	-	-
		117,095,176.89	187,095,177.09

16	උපචිත වියදම් සඳහා වෙන්කිරීම්	2014	2013
	විගණන ගාස්තු	1,645,813.00	1,285,813.00
	ආදායම් බදු	7,200,000.00	6,600,000.00
	උපචිත වියදම්	197,331.92	94,626.00
		9,043,144.92	7,980,439.00

17 **කලින් ලැබීම්**

	2014	2013
කලින් ලැබීම් LLDF	2,146,294.51	1,426,709.72
කලින් ලැබීම් UDLIHP	4,457,541.40	3,015,506.00
කලින් ලැබීම් LGIIP	4,387,136.56	7,302,283.86
	10,990,972.47	11,744,499.58

18 **ජංගම බදු වගකීම**

	2014	2013
වර්ෂයේ ආරම්භක ශේෂය	1,899,222.08	2,842,671.08
එකතු කළා - වර්ෂය සඳහා වෙන්කිරීම්	1,300,000.00	1,800,000.00
	3,199,222.08	4,642,671.08
අඩු කළා - 2013/2014 වර්ෂ සඳහා ගෙවීම්	(1,340,629.93)	(1,407,663.00)
අඩු කළා - රඳවාගැනීමේ බදු	(1,280,876.65)	(1,335,786.00)
2014.12.31 දිනට ශේෂය	577,715.50	1,899,222.08

19 **පොළී ආදායම**

	2014	2013
LLDF	54,386,062.03	51,154,999.68
UDLIHP	120,567,659.50	92,909,676.74
PCDP	5,105,948.50	7,430,732.43
LGIIP	142,681,703.28	147,407,845.45
NW&DB	870,068.60	917,266.98
	323,611,441.91	299,820,521.28

20 **පොළී වියදම**

	2014	2013
LLDF	18,642,043.92	20,378,514.40
UDLIHP	100,096,493.06	106,288,717.05
PCDP	5,194,976.77	5,874,564.82
LGIIP	35,515,308.32	35,651,957.00
	159,448,822.07	168,193,753.27

21	**වෙනත් ආදායම්**	**2014**	**2013**
	අවිනිශ්චිත ලැබීම්		
	LLDF	-	-
	UDLIHP	-	-
	PCDP	-	-
	LGIIP	-	-
	ද්‍රවශීලතා හානිකරණ ආදායම		
	LLDF	-	-
	UDLIHP	-	
	PCDP	-	
	LGIIP	527,555.45	2,763,630.48
	වෙනත් ආදායම්		
	LLDF	142,760.61	4,783,325.10
	UDLIHP	-	-
	PCDP	-	-
	LGIIP	-	-
		670,316.06	7,546,955.58

22 **පරිපාලන වියදම්**

	2014	2013
කාර්යමණ්ඩල වැටුප්	8,197,134.51	5,700,07.81
ජීවනාධාර දීමනාව	2,862,600.00	1,821,600.00
ප්‍රසාද දීමනා	804,375.00	240,416.00
සභාපති දීමනා	475,590.00	475,590.00
දිරි දීමනා - UDLIHP	489,324.00	72,000.00
කොමසාරිස් මණ්ඩල ප්‍රවාහන දීමනා	163,380.00	348,080.00
කොමසාරිස් මණ්ඩල දීමනා	722,400.00	672,600.00
E.P.F	1,267,967.46	894,566.32
E.T.F	316,991.86	223,641.32
පාරිතෝෂික දීමනා ගෙවීම්	567,917.08	338,722.29
අතිකාල සහ නිවාඩු දින වැටුප්	224,912.84	168,330.82
කාර්යමණ්ඩල සුභසාධක වියදම්	236,869.32	148,497.00
රැස්වීම් වියදම්	94,849.10	61,938.00
විගණන ගාස්තු ගෙවීම්	360,000.00	360,000.00
දුරකථන සහ තැපැල්	405,998.39	213,058.28
ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ වියදම්	573,538.19	300,156.74
වාහන නඩත්තු වියදම් - 54/6233	54,400.00	54,400.00
ඉන්ධන	405,668.43	228,227.00
විදුලි ගාස්තු	565,739.65	490,308.16
ආරක්ෂක ගාස්තු	356,474.40	270,441.20
ජල ගාස්තු	52,025.50	38,363.00
පවිත්‍රතා වියදම්	262,339.00	186,132.40
උපකරණ සහ නඩත්තු	419,541.57	234,469.43
ගොඩනැගිලි නඩත්තු	468,022.95	40,572.00
කාර්යමණ්ඩල පුහුණු	376,716.00	969,459.92
පරිගණක නඩත්තු වියදම්	641,930.00	18,350.00
කාර්යාල කුලී	701,110.00	701,110.00
වැඩමුළු	200,000.00	-
උපකරණ ක්ෂය	82,899.06	148,914.30
ගෘහභාණ්ඩ ක්ෂය	1,051,169.20	30,328.17
පරිගණක මෘදුකාංග සහ දෘඩාංග ක්ෂය	-	441,744.55
LLDF නවීකරණ වත්කම් ක්ෂය	312,239.34	579,096.48
මෝටර් වාහන ක්ෂය	799,500.00	-
නීතිඥ ගාස්තු	-	4,050.00
බැංකු ගාස්තු	9,695.18	948.52
සංවර්ධන නිලධාරී - ගමන් වියදම්	1,162,536.41	773,799.06
	25,991,061.44	17,249,939.09

23	පළාත් පාලන ආයතන වෙත ලබාදුන් ප්‍රදාන - LGIIP	2014	2013
	ප්‍රදාන ක්‍රමක්ෂය - වියදම	318,907,755.43	383,103,645.50
	ප්‍රදාන ක්‍රමක්ෂය - ආදායම	(123,805,252.34)	(132,940,992.32)
		195,102,503.09	250,162,653.18

24	මූල්‍ය ආදායම	2014	2013
	පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත්		
	LLDF	870,127.75	1,145,557.04
	UDLIHP	2,648,651.17	4,740,259.50
	PCDP	-	-
	LGIIP	993,244.15	1,238,885.02
	පොළී ආදායම - ඉතිරි කිරීමේ ගිණුම		
	LLDF	996,674.83	789,390.81
	UDLIHP	2,381,857.52	1,673,474.65
	PCDP	-	-
	LGIIP	3,945,923.01	2,100,961.79
	පොළී ආදායම - ස්ථාවර තැන්පතු		
	LLDF	2,180,367.14	6,056,833.68
	UDLIHP	4,854,038.36	8,726,176.60
	PCDP	-	-
	LGIIP	95,818.47	349,764.34
		18,966,702.40	26,821,303.43

ගිණුම්කරණ ප්‍රතිපත්ති

වාර්තාමය ඒකකය

දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LL&DF) නෛතික ඒකකයක් වශයෙන් 1916 අංක 22 දරණ දේශීය ණය සහ සංවර්ධන ආඥා පණත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, ආංශික මූල්‍ය ප්‍රකාශයන්ද එහි, උප කාර්යයන්ද ආවරණය කරයි. දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ මෙහෙයුම් තුල ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘති වල ණය අයකිරීම් සිදුකරනු ලබයි. එනම් නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP), බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP) හා පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) යන උපාංග වේ.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2008 සිට දේශීය ණය සහ සංවර්ධන අරමුදල තුල ක්‍රියාත්මක වේ. 2014 වර්ෂවල ගිණුම් සහ මූල්‍ය ප්‍රතිඵල ඒකාබද්ධ කර ඇත.

අනුකූලතා ප්‍රකාශන

ශේෂ පත්‍ර, ආදායම් ප්‍රකාශන හා මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව පිළියෙල කර ඇත.

පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සංකල්පයට අනුව පිළියෙල කර ඇති අතර උද්ධමනය සඳහා ගැලපීම් නොකොට ඒකාග්‍රතාවය සලකා ඇතත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට ලක් කොට ඇත.

ශ්‍රිතීය හා ඉදිරිපත් කිරීමේ මුදල්

ආසන්න ශතයට ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

ප්‍රමාණවත් බව හා එක්කාසු කිරීම

සමාන කාර්යයන් හා ස්වභාවයන් එක්කාසු කරමින් ප්‍රමාණවත් අයිතමයන් වෙන්ව දක්වා ඇත.

ඒකාබද්ධ කිරීමේ පදනම

දේශීය ණය සහ සංවර්ධන අරමුදල, නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP), බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP), පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP) උපාංශයන් වශයෙන් හඳුනාගෙන, සෘජු ආදායම් හා වියදම් වෙන්ව දක්වමින්, වර්ෂාවසානයේ එකට ඒකාබද්ධ කොට ඇත. වත්කම් හා වගකීම්ද ශේෂ පත්‍රය තුල ඒකාබද්ධ කොට ඇත.

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ කාර්යයන් (ව්‍යාපෘතියේ B උපාංගය) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට පවරා ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) මගින් එය ක්‍රියාත්මක වේ. එම අංශය තුල එහි මූල්‍ය ප්‍රකාශන වෙනම පිළියෙල කරනු ලැබේ. දේශීය ණය සහ සංවර්ධන අරමුදලට බලනොපාන මෙහෙයුම් වියදම් හා A උපාංගයට නිකුත් කරන ලද මුදල් හැර සියළුම වත්කම් හා වගකීම් ගිණුම් වල තොරතුරු දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ ගිණුම් තුල ඒකාබද්ධ කොට ඇත.

ව්‍යාපෘතිය විසින් මිලදී ගෙන සෘජුව දේශීය ණය සහ සංවර්ධන අරමුලට මාරු කරන ලද වත්කම් ද B උපාංගය සඳහා දෙන ලද ණය හා ප්‍රදානයන් හා ඒ සම්බන්ධ ගනුදෙනු ද, ඒකාබද්ධ ප්‍රකාශයන්ට පෙර උපාංග මූල්‍ය ප්‍රකාශන වලට ගෙන ඇත.

මුදල් හා මුදල් තුලනයන්

මුදල් හා මුදල් සමානායයන් තුල අතැති මුදල්, ස්ථාවර තැන්පතු හා ඉතුරුම් තැන්පත් අදාළ බැංකු ගිණුම් වල ශේෂයන් අන්තර්ගතය. ඒවායේ මතුපිට අගය මත ශේෂය ඉදිරියට ගෙන ඇත.

බැර හා හර ප්‍රදානයන්ගේ ක්‍රමක්ෂය

බැර ප්‍රදානයන් වන්නේ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ (LGIIP) B උපාංගය සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය සමග පළාත් පාලන ආයතන වලට නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල්ය. හර ප්‍රදානයන් වන්නේ පළාත් පාලන ආයතන වෙත ණය සමග නිකුත් කරන ලද ආධාර මුදල්ය. වියදමක් වශයෙන් සලකන ලද හර ප්‍රදානයන් අදාල කාර්යයෙන් ලැබෙන පොළී වලට අනුකූලව ක්‍රමවත් පදනමකට වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර එම පදනමට අනුකූලව බැර ප්‍රදානයන්ද ක්‍රමක්ෂය කරනු ලැබේ. මෙම වැඩපිළිවෙලේදී දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ බදුවලට පෙර ඒකාබද්ධ ලාභය බද්දට පෙර හා ශුද්ධ ක්‍රමක්ෂයට පෙර ලාභයෙන් 5% කට වඩා අඩු නොවිය යුතුය.

අක්‍රිය ණය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ස්ථාපිත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ගිණුම් ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලව දීර්ඝ කාලයක් නොලැබී තිබූ ණය වල ප්‍රාග්ධන කොටස හා පොළිය අක්‍රිය වූ ණය හා පොළී ලෙස සලකා පොළිය අවිනිශ්චිත වූ පොළී ගිණුමක උපචිත කරන අතර එය නිරන්තරයෙන් සමාලෝචනය කරනු ලැබේ.

පාඩු වූ ණය සඳහා ප්‍රතිපාදන

පාඩු වූ ණය හා සැක සහිත ආපසු අයකරගැනීම සඳහා වෙන් වෙන් වශයෙන් විශේෂ ප්‍රතිපාදනයන් කරනු ලැබේ.

අක්‍රීය ණය මත ආදායම් හඳුනාගැනීම

කිසියම් අත්තිවාරමක්/ ණයක් අක්‍රීය ලෙස සැලකූ කල පොළිය ආදායමක් වශයෙන් ගැනීම අත්හිටුවන අතර මුදල් පදනම මත පමණක් එය ආදායමට ගනු ලැබේ.

ක්ෂයවීම්

එක් එක් වත්කම් පංතිය අනුව පහත සඳහන් ලෙස සරල මාර්ග ක්‍රමයට ක්ෂයවීම් ප්‍රතිපාදනය කරනු ලැබේ.

සවිකිරීම්	-	25%
කායීල උපකරණ	-	20%
කාර්යාල ලී බඩු	-	05%
වාහන	-	20%

වත්කම් මිලයට ගත් වර්ෂයේ ක්ෂයවීම් ගණනය කරනු නොලැබේ.

දේපල හා යන්ත්‍රෝපකරණ

දේපල හා යන්ත්‍රෝපකරණ ඒවා මිලට ගත් පිරිවැය හෝ ඉදිකිරීම් පිරිවැය හෝ අනියම් වියදම් සහිත අගය කිරීම් වලින් ක්ෂයවීම් අඩු කොට වාර්තා කරනු ලැබේ. ඉදිකිරීම් වත්කම් භාවිත තත්වයට ගෙන ඒම සඳහා වූ වියදම් සියල්ල පිරිවැය තුල අන්තර්ගතය. කොන්ත්‍රාත් මත වූ ඉදිකිරීම් වල ගෙවන ලද කොන්ත්‍රාත් මිල ප්‍රාග්ධනිත කර ඇත.

ණය ප්‍රාග්ධනිත කිරීම

උප ව්‍යාපෘතීන් හි වැඩ කෙරීගෙන යන කාලය තුල නිකුත් කරන ලද ණය මුදල් වල පොළිය වැඩ අවසානයේ ණය මුදලට එකතු කොට මූලික මුදල සමග වාරික වශයෙන් ගෙවීමට කටයුතු යොදා ඇත. රඳවා ගැනීම් වලට පෙර අවසාන අතුරු ගෙවීම් දිනය එසේ පොළී ප්‍රාග්ධනිත කිරීම සඳහා ලුහු කායීය (cut off) දිනය වශයෙන් ගනු ලැබේ.

වගකීම්

ගෙවිය යුතු බිල් හා අනෙකුත් වගකීම් වල සියළුම මූල්‍ය වගකීම්, භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොළිය හා ගෙවිය යුතු ගාස්තු හා වියදම් ඇතුලත්ය.

පාරිතෝෂික

ස්ථිර සේවකයන්ගේ දළ වැටුපේ ප්‍රතිශතයක් වශයෙන් ඔවුන්ගේ පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කරනු ලැබේ.

අර්ථ සාධක අරමුදල

දේශීය ණය සහ සංවර්ධන අරමුදල සේවක අර්ථසාධක අරමුදලට 12% ක් දායක වන අතර සේවකයන්ගේ දායකත්වය 8% ක් වේ.

භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදලට දේශීය ණය සහ සංවර්ධන අරමුදල 3% ක දායකත්වයක් සපයයි.

ආදායම් ප්‍රකාශන

පොලී ආදායම්

ලැබිය යුතු පොලී උපචිත පදනමට ගණනය කරනු ලැබේ. අක්‍රීය ණය වල පොලිය අවිනිශ්චිත පොලී ගිණුමක සමුච්චය කොට මුදල් පදනමට ආදායමට හඳුනාගනු ලැබේ.

පොලී හා වෙනත් වියදම්
ගෙවිය යුතු පොලී හා වෙනත් වියදම් උපචිත පදනමට හඳුනාගෙන ඇත.

ණය සහ ගිවිසුම්

2006.01.19 දින ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කල ණය අංක 2201 SRI (SF) ක්‍රියාත්මක කිරීම සඳහා වූ ගිවිසුම් අනුව පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ B උපාංගය යටතේ ඇමරිකානු ඩොලර් 42.5 ක් දේශීය ණය සහ සංවර්ධන අරමුදලට වෙන්කොට ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ පළාත් පාලන ආයතන, වර්ගයට අනුව වෙනස් වන අනුපාතයකට ණය හා ආධාර ලබා ගනී.උප ණය ගිවිසුමේ 1.01 ඡේදයට අනුව හා ආසියානු සංවර්ධන බැංකුව සමග අත්සන් කළ ණය ගිවිසුමේ 3.01 (a) ඡේදයට අනුව දේශීය ණය සහ සංවර්ධන අරමුදලට දෙනු ලබන ණය ප්‍රමාණය විශේෂ හර ගැණුම් දෙසිය හතලිස් හය ලක්ෂ හැට හත් දහසක (SDR 24,667,000) කට සමාන මුදලකි, ණය ආපසු ගෙවීම, වසර 32 ක් තුල ත්‍රෛයිමාසිකව වාර 96 කින් වසර 08 ක සහන කාලයක් සහිතව හමාර කළ යුතුය.

පොලී ගෙවීම සහන කාලය තුල 1% ක් ද එයින් පසුව 1.5% ක් ද වේ. එය ත්‍රෛමාසික වාරය අවපාතයේ තිබූ ණය ශේෂය පදනම් කොටගෙන සිදුවේ.

පළාත් පාලන ආයතනයන්ට දෙන ලද ණය මුදල සඳහා 9% පොලියක් අයකරන අතර ආධාර ප්‍රමාණයෙන් වැඩි ප්‍රතිශතයක් අරමුදල් වල පොලී ආන්තිකයෙන් ආවරණය කරගත යුතු වේ. ඒ නිසා අරමුදල් කළමනාකරණය දේශීය ණය සහ සංවර්ධන අරමුදලේ අනාගතයට දැඩි බලපෑමක් ඇති කරයි.



එච්.ටී.කමල් පත්මසිරි
සභාපති
දේශීය ණය සහ සංවර්ධන අරමුදල
(ලේකම් - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය)

දේශීය ණය සහ සංවර්ධන අරමුදල
2014.12.31 දිනට ණය නිකුත් කිරීම

අංක	පළාත් පාලන ආයතනය	පළාත	මුදල (රු.)	සතිපොළ ඉදිකිරීම සහ සංවර්ධනය	පානීය ජල ව්‍යාපෘති	ආදාහනාගාර ඉදිකිරීම	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම	ට්‍රැක්ටර් මිලදී ගැනීම	ඩබල් කැබ් මිලදී ගැනීම	වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති
1	දෙවිනුවර ප්‍රා.ස	දකුණු	3,000,000				3,000,000				
2	පූජාපිටිය ප්‍රා.ස	මධ්‍යම	2,216,000				2,216,000				
3	බලපිටිය ප්‍රා.ස	දකුණු	2,520,000	2,520,000							
4	මඩුල්ල ප්‍රා.ස	ඌව	8,000,000				8,000,000				
5	ගල්ගමුව ප්‍රා.ස	වයඹ	5,500,000			5,500,000					
6	කහවත්ත ප්‍රා.ස	සබරගමුව	11,140,000					11,140,000			
7	පස්ගොඩ ප්‍රා.ස	දකුණු	2,775,000	2,775,000							
8	තලවකැලේ ලිඳුල න.ස	මධ්‍යම	5,600,000			5,600,000					
9	කළුතර ප්‍රා.ස	බස්නාහිර	6,100,000			6,100,000					
10	මාතලේ ප්‍රා.ස	මධ්‍යම	6,000,000							6,000,000	
11	දෙහිවල ගල්කිස්ස ම.න.ස	බස්නාහිර	8,850,000				8,850,000				
12	මහරගම න.ස	බස්නාහිර	3,000,000						3,000,000		
13	අඹගමුව ප්‍රා.ස	මධ්‍යම	13,627,730					13,627,730			
14	කලවාන ප්‍රා.ස	සබරගමුව	3,500,000					3,500,000			
15	තුම්පනේ ප්‍රා.ස	මධ්‍යම	6,825,000					6,825,000			
16	තමන්කඩුව ප්‍රා.ස	උතුරු මැද	29,100,000					29,100,000			
17	වැලිගම න.ස	දකුණු	3,900,000				3,900,000				
18	මිනුවන්ගොඩ ප්‍රා.ස	බස්නාහිර	26,000,000					26,000,000			

අංක	පළාත් පාලන ආයතනය	පළාත	මුදල (රු.)	සතිපොළ ඉදිකිරීම සහ සංවර්ධනය	ජාතික ජල ව්‍යාපෘති	ආදාහනාගාර ඉදිකිරීම	යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	පොදු වෙළඳ සංකීර්ණ ඉදිකිරීම	ට්‍රැක්ටර් මිලදී ගැනීම	ඩබල් කැබ් මිලදී ගැනීම	වෙනත් ආදායම් උත්පාදක ව්‍යාපෘති
19	කඩුවෙල ම.න.ස	බස්නාහිර	40,000,000	40,000,000							
20	ඉමදූව ප්‍රා.ස	දකුණු	2,280,000	2,280,000							
21	වෙන්නප්පුව ප්‍රා.ස	වයඹ	910,000								910,000
22	පස්බාගෙ කෝරලේ ප්‍රා.ස	මධ්‍යම	5,000,000		5,000,000						
23	වනාතවිල්ලුව ප්‍රා.ස	වයඹ	20,000,000				20,000,000				
24	කොටපොල ප්‍රා.ස	දකුණු	9,200,000				9,200,000				
25	අනුරාධපුර ම.න.ස	උතුරු මැද	31,249,000				31,249,000				
26	වාරියපොල ප්‍රා.ස	වයඹ	7,400,000			6,500,000					900,000
27	නාරම්මල ප්‍රා.ස	වයඹ	4,700,000			4,700,000					
28	උඩුබද්දාව ප්‍රා.ස	වයඹ	3,000,000			3,000,000					
29	කුරුණෑගල ප්‍රා.ස (දියබාව)	වයඹ	6,500,000			6,500,000					
30	කුරුණෑගල ප්‍රා.ස (මාස්පොත)	වයඹ	6,500,000			6,500,000					
31	රිදීගම	වයඹ	6,500,000			6,500,000					
32	ආණමඩුව ප්‍රා.ස	වයඹ	6,250,000			6,250,000					
33	හලාවත න.ස	වයඹ	6,250,000			6,250,000					
	එකතුව		303,392,730	47,575,000	5,000,000	63,400,000	86,415,000	90,192,730	3,000,000	6,000,000	1,810,000

ණය නිකුත් කිරීම - පළාත් අනුව
2014 වර්ෂය

පළාත	මුදල (රු.)	ප්‍රතිශතය (%)
බස්නාහිර	83,950,000	27
දකුණු	23,675,000	08
වයඹ	73,510,000	24
මධ්‍යම	39,268,730	13
සබරගමුව	14,640,000	05
උතුරු මැද	60,349,000	20
ඌව	8,000,000	03
එකතුව	303,392,730	100



ණය නිකුත් කිරීම - 2014 වර්ෂය
පළාත් පාලන ආයතන වර්ගය අනුව

පළාත් පාලන ආයතන වර්ගය	මුදල (රු.)	ප්‍රතිශතය (%)
මහ නගර සභා	80,099,000	26
නගර සභා	18,750,000	06
ප්‍රාදේශීය සභා	204,543,730	67
එකතුව	303,392,730	100



දේශීය ණය සහ සංවර්ධන අරමුදල

මහා භාණ්ඩාගාරය වෙත ණයආපසු ගෙවීම් 2010 - 2014

වර්ෂය	වාරික				පොළිය				මුළු එකතුව රුපියල් මිලියන
	LLDF	PCDP	UDLIHP	LGIIP	LLDF	PCDP	UDLIHP	LGIIP	
2010	22.9	0.17	56.2	-	25.1	6.0	67.2	-	177.7
2011	22.9	1.15	56.2	-	23.5	6.0	67.2	34.7	211.6
2012	22.9	1.26	109.6	-	21.8	7.6	90.8	29.0	283.0
2013	22.8	1.02	90.8	-	20.4	5.8	99.0	35.6	275.4
2014	22.5	3.80	90.8	-	18.6	5.2	100.0	35.0	275.9
එකතුව	114.0	7.40	403.6	-	109.4	30.6	424.2	134.3	1223.6

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ (LGIIP) නිකුත්කළ ණය මුදල් සඳහා සහන කාලය තුළදී පොළිය පමණක් මහා භාණ්ඩාගාරය වෙත ආපසු ගෙවීම කරනු ලැබේ.

LLDF	දේශීය ණය සහ සංවර්ධන අරමුල මගින් නිකුත් කළ ණය
PCDP	බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය මගින් නිකුත්කළ ණය මුදල්
UDLIHP	නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය
LGIIP	පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්
2010 – 2014
දේශීය ණය සහ සංවර්ධන අරමුදල

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2010	22.9	25.1
2011	22.9	23.5
2012	22.9	21.8
2013	22.8	20.4
2014	22.5	18.6



මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම්
2010 –2014
බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය (PCDP)

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2010	0.17	6.0
2011	1.15	6.0
2012	1.26	7.6
2013	1.02	5.8
2014	3.80	5.2



මහා භාණ්ඩාගාරය වෙත ණයආපසු ගෙවීම් 2010–2014

නාගරික සංවර්ධන සහ අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය (UDLIHP)

රුපියල් මිලියන

වර්ෂය	වාරික	පොළිය
2010	56.2	67.2
2011	56.2	67.2
2012	109.6	90.8
2013	90.8	99.0
2014	90.8	100.0



මහා භාණ්ඩාගාරය වෙත ණය ආපසු ගෙවීම් 2011–2014
පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (LGIIP)

රුපියල් මිලියන

වර්ෂය	මහා භාණ්ඩාගාරය වෙත පොළී ගෙවීම්
2011	34.7
2012	29.0
2013	35.6
2014	35.0



දේශීය ණය සහ සංවර්ධන අරමුදල
කාර්ය සාධනය 2010 - 2014

රු.'000

වර්ෂය	නිකුත් කළ ණය	ණය වාරිකඅයකිරීම්	ණය පොළී අයකිරීම්
2010	126,195	120,487	50,062
2011	105,707	131,766	49,899
2012	76,249	115,281	51,231
2013	225,479	124,086	54,394
2014	303,392	130,626	53,694







විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } බීඑෆ්/ජී/එල්එල්ඩීඑෆ්/1/14/1

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ජුලි 25 දින

සභාපති,

දේශීය ණය හා සංවර්ධන අරමුදල

දේශීය ණය හා සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

දේශීය ණය හා සංවර්ධන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා රඳවාගත් ඉපැයුම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (I) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක්

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ අභිතකර විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 අභිතකර විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණවත් ලෙස බලපෑ හැකිව තිබුණි.

2 මූල්‍ය ප්‍රකාශන

2.1 අභිතකර විගණන මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2014 දෙසැම්බර් 31 දිනට දේශීය ණය හා සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොමැති බව මා දරන්නා වූ මතය වේ.

2

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලං ගි ප්‍ර/ ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූල වීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලං ගි ප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

අරමුදල විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර තැන්පතු මත පොලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන නොතිබුණි.

(ආ) ශ්‍රී ලං ගි ප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ

(i) ප්‍රමිතියේ 55 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම එය භාවිතය සඳහා ලබාගත් අවස්ථාවේදී සිට ආරම්භ කළ යුතු වුවද, ප්‍රමිතියේ විධිවිධානවලට පටහැනිව අරමුදලේ වත්කම් මිලදී ගත් වර්ෂයේ සිට ක්ෂය කර තිබුණි.

(ii) ප්‍රමිතියේ 79 ඡේදය ප්‍රකාරව සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වලට අදාළ රු.1,023,128 ක දළ ධාරණ අගය සටහනක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදල විසින් එහි ස්ථාවර තැන්පතු මත පොලී ආදායම උපචිත පදනම මත ගණනය කර නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා පොලී ආදායම රු.9,551,435 කින් හා 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී රු.24,966,196 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පොලී බැර කරන අවස්ථාවේදී රු.1,280,877 ක රඳවාගැනීමේ බදු හා රු.492,161 ක මතිමාත්‍ර බදු නොසලකමින් ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම ශුද්ධ පදනම මත මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රු.1,773,038 කින් අඩුවෙන් දක්වා තිබුණි.

3

(ඇ) පරිගණක හා කාර්යාල උපකරණ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය ගණනය කර ආදායම් ප්‍රකාශනයට අයකර නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය සහ සමාලෝචිත වර්ෂය අවසානයට දේපල, පිරියත හා උපකරණ (PPE) වටිනාකම රු.906,423 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) 2014 වර්ෂයේ පරිගණක දෘඩාංග හා මෘදුකාංගවලට එකතුකිරීමක් ලෙස රු.2,349,238 ක මුදලක් දේපල, පිරියත හා උපකරණවලට සාවද්‍යව හරකර තිබුණි. කෙසේ වුවද, ඒ සඳහා අරමුදල විසින් කරන ලද බැර සටහනේ විස්තර මෙම වාර්තාවේ දිනය දක්වාත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන දේපල, පිරියත හා උපකරණවල නිවැරදිභාවය හා විශ්වාසවන්තභාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ඉ) 2012 වර්ෂයේදී පොදු ලෙජරයට සටහන් කරන ලද රු.3,586,139 ක් වූ දේශීය ණය හා සංවර්ධන අරමුදලේ නවීකරණය කරන ලද වත්කම්, ලී බඩු හා සවිකිරීම්වලට එකතුකිරීම් ලෙස 2014 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. තවද, කාර්ය මණ්ඩල පුහුණු වියදම් රු.958,169 ක් ද ලී බඩු හා සවිකිරීම් යටතේ වත්කමක් ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා මුළු වත්කම් හා ක්ෂය වටිනාකම පිළිවෙලින් රු.4,544,308 කින් හා රු.1,020,841 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට අයකරන ලද නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතියට (UDLIHP) අදාළ ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොලී පිළිවෙලින් රු.1,216,741 ක් හා රු.1,306,001 ක් 2013 වර්ෂයේදී ලැබී තිබුණි. කෙසේ වුවද, මෙය මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස අඛණ්ඩව ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(උ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.19,500,745 ක මුදලක් ජංගම වත්කම් යටතේ මුදල් ශේෂයක් ලෙස මෙන්ම ජංගම වගකීම් යටතේද දක්වා තිබුණි. මෙම ශේෂ හඳුනා ගැනීමට හා සමාලෝචිත වර්ෂය අවසානයට අයකර ගැනීමට හෝ නිරවුල් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඌ) විගණනයට ඉදිරිපත් කරන ලද ණය උපලේඛනය අනුව, දඹුල්ල මහ නගර සභාවෙන් සහ මහනුවර මහනගර සභාවෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොලී පිළිවෙලින් රු.17,929,308 ක් හා රු.21,948,185 ක් විය. කෙසේ වුවද, මෙම ශේෂ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

2.2.3 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 වර්ෂයේ සිට අරමුදල අඛණ්ඩව පාඩු ලබමින් පවත්වා ගෙන ගොස් තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදලේ ශුද්ධ වත්කම් වටිනාකමෙහි සැලකිය යුතු පිරිහීමක් ඇති වී තිබුණි. මහා භාණ්ඩාගාරයේ සහායක් නොමැතිව අඛණ්ඩ පැවත්ම සඳහා අරමුදලේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කරවන මෙම කරුණ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් දක්වයි. තවද, මෙම කරුණ අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකරයි.

2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණය ශේෂ වටිනාකම හා විගණනයට ඉදිරිපත් කරන ලද අනුරූපී වාර්තා අතර රු.700,805,504 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන ණය ශේෂ සහ හානිකරණ ප්‍රතිපාදනය සඳහා සලකා ඇති ණය ශේෂ අතර රු.1,996,692,218 ක වෙනසක් නිරීක්ෂණය විය. වෙනස සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ඇ) ලැබුණු සනාථ කිරීම් අනුව, 2014 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර බිල්පත්වල කරන ලද මුළු ආයෝජනය රු.70,454,440 ක් විය. කෙසේ වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.59,230,275 ක් ලෙස දක්වා තිබුණි. රු.11,224,165 ක් වූ වෙනස සඳහා හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) බැංකු සනාථ කිරීම් අනුව, 2014 දෙසැම්බර් 31 දිනට ඉතිරිකිරීම් තැන්පතුවල ශේෂය රු.43,502,811 ක් විය. කෙසේ වුවද එය මූල්‍ය ප්‍රකාශනවල රු.99,097,477 ක් ලෙස දක්වා තිබුණි. එබැවින්, ඉතිරිකිරීමේ ගිණුමේ තැන්පතු රු.55,594,666 කින් වෙනස් වී තිබුණි.

5

AGDSL

(ඉ) ලැබුණු තොරතුරු අනුව, 2014 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොලී රු.5,784,198 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.117,095,177 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් එම වටිනාකම් දෙක අතර රු.111,310,979 ක පැහැදිලි නොකළ වෙනසක් නිරීක්ෂණය විය.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් ණය සඳහා වාර්ෂික පොලී අනුපාතය සියයට 10 සිට සියයට 6 දක්වා අඩුකිරීම සඳහා 2014 ඔක්තෝබර් 03 දින කොමසාරිස් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනට රු.617,697,468 ක් වටිනා ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අරමුදල විසින් ඒ අනුව පියවර ගෙන නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 134 ක බදු පූර්ව ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව රු.මිලියන 246 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 112 ක හෙවත් සියයට 84 ක වර්ධනයක් දැක්වුණි.

ඉකුත් වර්ෂයේ අනුරූපී සංඛ්‍යා සමඟ සැසඳීමේදී රු.32,535,852 කින් හෙවත් සියයට 24.7 කින් ශුද්ධ පොලී ආදායම වැඩිවීම සහ රු.48,219,301 කින් හෙවත් සියයට 33.2 කින් සහ රු.55,060,150 කින් හෙවත් සියයට 22 කින් පිළිවෙලින් හානිකරණය හා ක්‍රමක්ෂය අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අගය එකතු කිරීම රු.115,324,361 ක සෘණ අගයක් දක්වා තිබූ අතර එය ඉකුත් වර්ෂයේදී ද රු.233,530,390 ක සෘණ අගයක් වී තිබුණි. එබැවින්, පෙර වර්ෂයට සාපේක්ෂව අගය එකතු කිරීම රු.118,206,029 කින් වැඩි වී තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ලැබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අරමුදලේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

6

අනුපාතය	2014	2013
මුළු ආදායමට ශුද්ධ පාඩුව (ප්‍රතිශතය)	39.07	73.75
ජංගම වත්කම් අනුපාතය (වාර ගණන)	23.19	16.7

ඉහත ගණනය කිරීම් අනුව, ආදායමට ශුද්ධ පාඩුව සමාලෝචිත වර්ෂයේදී සියයට 34.68 කින් සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1993 අංක 24 දරන දේශීය ණය සහ සංවර්ධන (සංශෝධන) පනතේ 5 වගන්තිය අනුව අරමුදල විසින් ලබාදෙනු ලබන ණය සඳහා අරමුණ මහජන උපයෝගීතාවය පිළිබඳ කිසියම් කාර්යයක් සඳහා ලබාදීම වන අතර තාක්ෂණික සහාය ඇතුලු වගකීම භාරගැනීම කෙරෙහි එම අධිකාරිය නීතිය මගින් අනුමත කෙරේ. ඒ අනුව අරමුදල විසින් වර්ග 05 ක් යටතේ ණය ලබා දී තිබූ අතර 2014 වර්ෂය හා ඉකුත් වර්ෂය අවසානයට හිඟ ශේෂය පහත පරිදි වේ.

වර්ගය	හිඟ ණය ශේෂය	
	2014 දෙසැම්බර් 31 දිනට	2013 දෙසැම්බර් 31 දිනට
	රු.	රු.
දේශීය ණය හා සංවර්ධන අරමුදල	816,654,556	638,603,693
නාගරික සංවර්ධනය හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	1,711,357,137	1,761,718,573
පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	1,694,276,103	1,810,665,745
නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය	67,847,623	69,356,658
ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය	8,717,505	9,215,880
එකතුව	4,298,852,924	4,289,560,549

7

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, නාගරික සංවර්ධනය හා අඩු ආදායම් නිවාස සහ පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යන වර්ග යටතේ 2013 වර්ෂයේදී හා 2014 වර්ෂයේදී පිළිවෙලින් සියයට 83 කට හා සියයට 79 කට වැඩි ප්‍රමාණයක මූල්‍ය පහසුකම් අරමුදල විසින් ලබා දී තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට දිගුකාලීන හිඟ ණය ශේෂ රු.මිලියන 2,335.23 ක් වූ අතර එහි රු.මිලියන 1,402.53 ක හිඟ ප්‍රාග්ධන ශේෂ හා රු.මිලියන 932.70 ක හිඟ පොලී ශේෂ අඩංගු වේ. විස්තර පහත දැක්වේ.

ණය වර්ගය	ආරම්භක ණය	ප්‍රාග්ධන හිඟය	පොලී හිඟය	මුළු හිඟය
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන
පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	492.12	484.99	135.77	620.76
දේශීය ණය සහ සංවර්ධන අරමුදල	32.25	31.73	2.43	34.16
නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය	12.00	12.00	17.93	29.93
නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	919.45	873.81	776.57	1,650.38
	1,455.82	1,402.53	932.70	2,335.23

(i) 2014 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ණය පොලී වලින් පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය, නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය හා නාගරික සංවර්ධන හා අඩු ආදායම් ව්‍යාපෘතියේ ණය සඳහා අදාළ හිඟ පොලී පිළිවෙලින් සියයට 22 ක් සියයට 60 ක් හා සියයට 47 ක් විය.

(ii) ඉහත හිඟ ණය ශේෂවලට අදාළ කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(iii) නිත්‍ය භෝග සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දඹුල්ල ප්‍රාදේශීය සභාවට ලබාදුන් රු.12,000,000 ක ණය 2010 දෙසැම්බර් 31 දිනට නිරවුල් කළ යුතු විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් එක් වාරිකයක් හෝ අරමුදල විසින් අයකරගෙන නොතිබුණි.

4.2 කොන්ත්‍රාත් පරිපාලනය

සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද රු.3,286,729 ක් වටිනා ගොඩනැගිලි අලුත්වැඩියා කොන්ත්‍රාත්තුවට අදාළව අරමුදල විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පහත සඳහන් අවශ්‍යතාවයන් අනුගමනය කර නොතිබුණි.

(අ) 2.8.1 (අ) මාර්ගෝපදේශය - එක් සාමාජිකයෙකුට ප්‍රසම්පාදන කමිටුව හා තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකෙහිම කටයුතු කළ නොහැකි නමුත් එක් පුද්ගලයකු කමිටු දෙකෙහිම සාමාජිකයකු ලෙස පත්කර තිබුණි.

(ආ) 5.2.1 මාර්ගෝපදේශය - සාර්ථක ලංසුකරුවකුට ලංසු ලියකියවිලි පිළියෙල කිරීම සඳහා අත්‍යවශ්‍ය සියලු අදාළ තොරතුරු ලංසු ලියකියවිලි මඟින් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, මෙම කාර්යය සඳහා නිකුත් කරන ලද ලංසු ලියකියවිලිවල ලංසු විවෘත කිරීමේ දිනය හා වේලාව දක්වා නොතිබුණි.

(ඇ) 5.3.1 හා 5.3.5 (අ) මාර්ගෝපදේශ - ලංසු කැඳවීම සඳහා සම්මත ලංසු ලියකියවිලි භාවිතා කර නොතිබූ අතර ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ ලියාපදිංචි වීමේ අවශ්‍යතාවය ලංසු ලියකියවිලිවල සඳහන් කර නොතිබුණි.

(ඈ) 6.1.4 මාර්ගෝපදේශය - ලංසු ලියකියවිලි නිකුත් කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් අරමුදල විසින් තබා ගෙන නොතිබුණි.

(ඉ) 8.13.3 මාර්ගෝපදේශය - සාමාන්‍යයෙන් විචලනයන් හා අසම්භාව්‍ය ප්‍රතිපාදන ඇස්තමේන්තු කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ක් නොඉක්මවිය යුතුය. කෙසේ වුවද, මෙම කොන්ත්‍රාත්තුවට අදාළව සියයට 107 ක විචලනයක් නිරීක්ෂණය විය.

4.3 මානව සම්පත් කළමනාකරණය

1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් චක්‍රලේඛයේ විධිවිධාන අනුව, පුරප්පාඩු තනතුරක රාජකාරී ආවරණය කිරීම මාස 03 ක කාලයකට සීමා විය යුතුය. කෙසේ වුවද, අරමුදලේ අධ්‍යක්ෂ හෝ ප්‍රධාන විධායක නිලධාරී සහ සහකාර ගණකාධිකාරී 2014 වර්ෂයේ සිට වැඩ බැලීමේ පදනම මත සේවයේ යොදවා තිබුණි.

4.4 කළමනාකරණ කාර්යයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු වලින් ලැබුණු සනාථ කිරීම්වලට අනුව, 2014 දෙසැම්බර් 31 දිනට අරමුදල විසින් රු.43,502,810 ක මුදලක් බැංකු ගිණුමක පවත්වා ගෙන ගොස් තිබුණු අතර එම ගිණුමේ 2014 ජනවාරි 01 දිනට ශේෂය රු.158,587,835 ක් විය. ඒ අනුව විධිමත් ආයෝජන ප්‍රභවවල අතිරේක අරමුදල් ආයෝජනය කිරීම මඟින් උපරිම ආදායම ලබාගැනීම සඳහා අරමුදල විසින් එහි මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීමට අපොහොසත් වී තිබුණි.

(ආ) අරමුදල විසින් රජයෙන් ලැබී තිබුණු ප්‍රදාන හා අරමුදල විසින් ලබා දී තිබූ ප්‍රදානයන් විශේෂිත ක්‍රමයක් යොදා ගනිමින් ක්‍රමක්ෂය කර තිබුණි. කෙසේ වුවද, මෙම ක්‍රමවේදය සඳහා කොමසාරිස් මණ්ඩලයෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

5.1 අයවැය ලේඛනමය පාලනය

කාර්යාල ගොඩනැගිල්ල, පුස්තකාලය හා අනුස්මරණ ශාලා ඉදිකිරීම සහ වෙනත් ආදායම් ජනනය කරන ව්‍යාපෘති ඇතුළත් කාර්යයන් 2 ක් සඳහා අරමුදල විසින් රු.මිලියන 85 ක් ඇස්තමේන්තු කර තිබුණද, එම කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළ ආරම්භ කර හෝ නොතිබුණි. ඒ අනුව, අයවැය ඇස්තමේන්තුවේ වෙනත් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම ව්‍යාපෘතිවලට වෙන්කරන ලද අරමුදල් උපයෝජනය කර තිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

අරමුදලේ අභ්‍යන්තර විගණන කාර්යයන් ආවරණය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක පත්කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ එක් විගණන විමසුමක් පමණක් නිකුත් කර තිබුණි. 2011 වර්ෂයේ සිට අරමුදල විසින් අඛණ්ඩ පාඩු ලබා ඇති බැවින් හා 2014 දෙසැම්බර් 31 දිනට සෘණ ශුද්ධ වත්කම් රු.939,752,302 ක් පවතින බැවින් අරමුදලේ ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා වෙනම අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

පාලන ක්ෂේත්‍රය	නිරීක්ෂණ
(අ) ගිණුම්කරණය	ණය ශේෂවල පැහැදිලි නොකරන ලද වෙනස්කම් අවමකර ගැනීම සඳහා අරමුදල විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගත යුතු වීම.
(ආ) ණය ලිපිගොනු පවත්වා ගැනීම.	අවශ්‍ය තොරතුරු ඇතුළත් කිරීමෙන් තොරව ණය ලිපිගොනු පවත්වා ගැනීම.
(ඇ) අක්‍රිය ණය	සමාලෝචිත වර්ෂය අවසානයට වාර්තා කරන ලද අක්‍රිය ණය ශේෂ අයකර ගැනීම සඳහා දැඩි ක්‍රියාමාර්ග නොගැනීම.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

11